පූජාපිටිය ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 14 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.38,291,274 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතු වටිනාකම තුළ අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.7,510,560 ක් වූ අතර, අවුරුදු 05 ක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.71,505 ක් විය. 2018 මාර්තු 31 දිනට රු.37,915,431 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතු වටිනාකම වූ රු.28,481,866 ක් තුළ අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල එකතුව රු.4,777,123 ක් වූ අතර, එහි අවුරුදු 05 ක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.3,283,123 ක් විය.

1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.1,950,622 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.3 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7), 207 සහ 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1(අ)(1), 6.3.1(ආ) හා 6.3.6 ඡේදවල විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව අවස්ථා 13 කදි රු.1,445,951 ක් වටිනා කබඩ්, අල්මාරි හා ටයර් මිල දී ගෙන තිබුණි.**

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, **2017** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**12,787,258** ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**11,992,559** ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,137,578 | 3,119,364 | 3,156,978 | 2,197,088 | 3,461,000 | 3,135,199 | 3,836,729 | 2,234,704 |
| (ii) | කුලී | 4,971,300 | 1,097,650 | 866,155 | 316,645 | 3,811,600 | 924,600 | 1,049,995 | 84,165 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,245,100 | 1,573,250 | 1,573,250 | -- | 1,511,000 | 1,623,000 | 1,623,000 | -- |
| (iv) | වෙනත් ආදායම් | 14,475,000 | 17,460,758 | 25,387,539 | 19,645,448 | 11,401,000 | 19,026,872 | 21,663,144 | 9,837,078 |
| | එකතුව | 24,828,978 | 23,251,022 | 30,983,922 | 22,159,181 | 20,184,600 | 24,709,671 | 28,172,868 | 12,155,947 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමස්ථ ආදායම් ප්‍රභවයන්ගෙන් **2016** දෙසැම්බර් **31** දිනට පැවති රු.**12,155,947** ක් වූ හිඟය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.**22,159,181** ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට **82** ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

(අ) **2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.2,220,610 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.3,117,181 ක් වී තිබුණි. ඉන් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.1,234,049 ක් හා රු.1,921,139 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 55 ක් හා සියයට 62 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.2,182,603 ක හිඟ ශේෂයක් පැවති අතර, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි. 2018 මාර්තු 31 දිනට රු.1,854,549 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

(ආ) **2017 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් හා ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලයෙන් වර්ෂ කීපයක සිට අය කර ගත යුතු රු.92,761 ක හිඟ වරිපනම් මුදලක් පැවතුණි.**

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට රු.14,485 ක හිඟ අක්කර බදු මුදලක් පැවති අතර, එම මුදලින් රු.12,579 ක් වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. 2018 මාර්තු 31 දිනට රු.12,891 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

2.2.4 කුලී

------

2017 දෙසැම්බර් 31 දිනට අඹතැන්න වෙළඳ සංකීර්ණයේ අංක 03 හා 04 කඩ කාමරවලින් රු.272,000 ක කඩ කුලියක් අය වීමට තිබූ අතර, මෙම මුදල් වසර 01 ත් වසර 09 ත් අතර කාල පරාසයක සිට අය නොවී පැවතුණි. 2018 අප්‍රේල් 30 දින වන විට රු.136,000 ක මුදලක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.810,011 ක් හා මුද්දර ගාස්තු රු.18,254,537 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්යසාධනය

----------------

(අ) රු.7,581,000 ක වටිනාකමකට සකස් කළ සංවර්ධන යෝජනා 29 ක් පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය සඳහා 2017 අප්‍රේල් 20 දින ඉදිරිපත් කර තිබුණි. ඉන් යෝජනා 25 ක් හා අනුමැතියට යවා නොතිබූ වෙනත් යෝජනාවක් 2017 අගෝස්තු 22 දින අනුමත කිරීම නිසා, යෝජනා අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා මාස 08 ක කාලයක් ගත කර තිබුණි. එසේ අනුමත කරන ලද සංවර්ධන යෝජනා 05 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. එසේම, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර වැඩ අවසන් කළ යුතු සංවර්ධන යෝජනා 06 ක, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භෞතික ප්‍රගතිය සියයට 20 සිට සියයට 40 දක්වා පරාසයක පැවතුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තියේ අරමුණුගත කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල යොදවා ගත යුතු වුවත්, ඉකුත් වර්ෂවල අවස්ථා 02 කදි රු.5,150,000 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මහජන සෞඛ්‍ය වැඩසටහන් යටතේ වැය විෂයයන් 04 කට වෙන් කර තිබූ රු.270,000 ක් අරමුණුගත කාර්යයන් ඉටු කර ගැනීමකින් තොරව සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. එසේම, වැය විෂයයන් 05 කට වෙන් කර තිබූ රු.355,000 කින් වැය කිරීම සියයට 02 සිට සියයට 75 දක්වා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) බල ප්‍රදේශයේ එකතු කරනු ලබන දිරන කසළ මසකට ටොන් 32 – 35 ක ප්‍රමාණයක් ට්‍රැක්ටර් ලෝඩ් 2.5 ක් සඳහා රු.500 ක් බැගින් ගෙවීම් කරමින් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය වෙත බැහැර කර ඇතත්, කොම්පෝස්ට් නිෂ්පාදනය හෝ විධිමත් කසළ කළමනාකරණ ක්‍රමයක් කෙරෙහි ප්‍රාදේශීය සභාවේ අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව සභාව දැනුවත් වී නොතිබූ බැවින්, ඒ සඳහා අයවැය ප්‍රතිපාදන සැලසීමට හෝ සැලසුම් සකස් කිරීමක් හෝ කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

(අ) 2017 නොවැම්බර් 30 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර පුරප්පාඩු තනතුරු 21 ක් පැවතුණි.

(ආ) කාර්යාල කාර්ය සහායක, ක්ෂේත්‍ර කම්කරු, ජල කම්කරු හා ප්‍රජාශාලා සහායක තනතුරු දරන පුද්ගලයින් 06 දෙනෙකු ආදායම් එකතු කිරීම, ආදායම් ලිපිගොනු කටයුතු, පුස්තකාල සහායක හා ඊ-නැණ පියස ව්‍යාපෘතියේ කටයුතු යනාදී වගකිව යුතු කාර්යාලගත රාජකාරීවල යොදවා ගෙන තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන ස්ථිර මුරකරු රාත්‍රී මුර සේවය සඳහා යොදවා නොගෙන සෞඛ්‍ය කම්කරුවෙක් රාත්‍රී මුර සේවය සඳහා යොදවා ගෙන තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

(අ) 2015 සිට 2017 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත් 588 ක් ලැබී ඉන් අයදුම්පත් 469 ක් අනුමත කර ඇතත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 16 ක් පමණි. එසේම, අනුකූලතා සහතික නිකුත් කර තිබූ සංවර්ධන සැලසුම් 16 කින් 09 දෙනෙකුගෙන් පමණක් වරිපනම් බදු අය කර ගෙන තිබුණි.

(ආ) කසළ කළමනාකරණය කිරීම සඳහා පෞද්ගලික වැවිලි සමාගමකට අයත් ඉඩම් කොටසක් පවරා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 2013 වර්ෂයේ දී රු.250,000 ක මුදලක් ගෙවා ඇතත්, එම ඉඩම සභාවට පවරා ගැනීමට හෝ අදාළ මුදල් ආපසු ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීවරයෙකු භාරයේ තිබූ නළ ළිං උපකරණවල 2015 වර්ෂයේ දී සිදුව තිබූ ඌනතාවයේ වටිනාකම රු.657,422 ක් වූ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

3.4.1 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

(අ) ධාවන තත්ත්වයේ පවතින හා නොපවතින විවිධ වර්ගයේ රු.13,650,662 ක් වටිනා වාහන 05 ක් හා වටිනාකම හඳුනා ගත නොහැකි වැන් රථයක් වර්ෂයකට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව/ ඌන උපයෝජිතව ගාල් කර තිබුණි.

(ආ) පෙර පාසල් ළමුන්ට අළෙවි කිරීම සඳහා 2012 පෙබරවාරි 23 දින රු.60,000 කට මිල දී ගෙන තිබූ පෙර පාසල් බෑග් 200 ක ප්‍රමාණයකින් රු.15,600 ක් වටිනා බෑග් 52 ක් අලෙවි කිරීමකින් තොරව ගබඩාවේ රඳවා තිබුණි.

3.4.2 වාහන උපයෝජනය

--------------------------

කැබ් රථයක් 2017 අගෝස්තු 04 දින අනතුරකට භාජනය වී රු.60,400 ක හානියක් සිදු වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104(3) පරිදි මූලික පරීක්ෂණය හා අවසන් පරීක්ෂණය සිදු කර නොතිබූ අතර, මු.රෙ.103(1)(ආ) ප්‍රකාරව පොලිස් වාර්තාවක් හෝ පැමිණිල්ලේ පිටපතක් ලබා ගෙන නොතිබුණි.

(ආ) අනතුරෙන් පසුව දින 05 ක කාලයක් තුළ අලුත්වැඩියාව නිම කර ඇතත්, 2017 දෙසැම්බර් 11 දින වන විටත් කැබ් රථය ආපසු රැගෙන විත් නොතිබුණි.

3.5 හඳුනාගත් පාඩු

------------------

(අ) 2017 දෙසැම්බර් 12 දිනට පැවති ගබඩා තොග ලෙජර ශේෂයන්, භෞතික ප්‍රමාණයන් සමඟ සැසඳීමේ දී, රු.21,571 ක් වටිනා භාණ්ඩ අයිතම 04 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ආ) ගබඩා ලේඛනයෙහි 2008 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එන වටිනාකමක් සොයා ගත නොහැකි බ්‍රාෂ් නිපල් ඒකක 10 ක් හා PVC ජල නළ උපාංග 33 ක් භෞතික පරීක්ෂාව සඳහා ඉදිරිපත් නොකෙරිණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

4.1 අයවැය පාලනය

------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයන් 04 ක සියයට 32 සිට සියයට 226 දක්වා ද, වියදම් විෂයන් 04 ක සියයට 23 සිට සියයට 58 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 54 ක් සඳහා වෙන් කර තිබූ රු.1,210,000 ක ප්‍රතිපාදන සියයට සියයක්ම භාවිතයට ගෙන නොතිබුණි.

(ඇ) අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය මත ඉදිරි වර්ෂය සඳහා පූර්ව වර්ෂයේ දී, ව්‍යාපෘති හඳුනා ගෙන ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කර ඒ අනුව, වාර්ෂික අයවැය පිළියෙල කළ යුතු වුවත්, සංවර්ධන යෝජනා 28 ක් සඳහා දළ වටිනාකමක් සටහන් කර අයවැය ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

අභ්‍යන්තර විගණන නිලධාරිනියට වෙනත් රාජකාරී කටයුතු පවරා තිබීම හේතුවෙන්, ප්‍රමාණවත් හා ස්වාධීන අභ්‍යන්තර විගණනයක් කිරීමට නොහැකි වී තිබුණි.

5. පද්ධති හා පාලන

------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය<br>---------- | අඩුපාඩුව<br>----------- |
|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | i. හිග ආදායම් අය නොකිරීම.<br>ii. බදු ගිවිසුම් විධිමත් නොවීම.<br>iii. බදු ගිවිසුම් අලුත් නොකිරිම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. අරමුදල් නිසි පරිදි උපයෝජනය නොකිරීම.<br>ii. වත්කම් ඌන උපයෝජිතව පැවතීම. |
| (ඇ) | ණයගැතියන් හා ණයහිමියන් | i. නිවැරදිව ගිණුම්ගත නොකිරීම.<br>ii. ණයගැතියෝ හා ණයහිමියෝ නිරවුල් නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | i. අපහරණය කළ යුතු වත්කම් අපහරණය නොකිරිම.<br>ii. ගබඩා ඌනතාවයන් පැවතීම. |